

# පිපුණු මලේ රුව

ශාකයේ පොදු නාමය -: පින්ක් ටෙකෝමා, රෝසි ට්‍රම්පට්, පින්ක් පුයි

ශාක කුලය -: බිග්නෝනියේසියේ (Bignoniaceae)

උද්භිද විද්‍යාත්මක නාමය -: *Tabebuia rosea*

බහුලව ව්‍යාප්ත වී ඇති රටවල් -: දකුණු මෙක්සිකෝව, වෙනිසියුලාව, ඉක්වදෝරය

සුදුසු දේශගුණය -: නිවර්තන දේශගුණය

ශාකයේ ස්වභාවය -: මීටර 30 දක්වා වැඩෙන සාමාන්‍ය ගසකි



සාමාන්‍ය තොරතුරු-: එල්සැල්වදෝරයේ ජාතික වෘක්ෂය ලෙස නම්කර ඇත්තේ මෙම ශාකයයි.හිරු එළිය ප්‍රියකරන අලංකාරය හා සෙවණ පිණිස වගා කරන පතනශීලි ශාකයකි.පසෙහි මද ආම්ලික,මද භාෂ්මික හා උදාසීන යන තත්ත්ව යටතේ සීග්‍රයෙන් වර්ධනය වීමට රුචිකත්වයක් දක්වයි.මෙම ශාකය, බීජ හා ලෙයර් ක්‍රමය මඟින් ව්‍යාප්ත කර ගත හැකිය.අතේ ඇඟිලි ආකාරයෙන් පිහිටි ඉලිප්සාකාර අසමාන පත්‍රිකා 5 කට බෙදුණු සංයුක්ත පත්‍ර ඇත.කඳෙහි පොත්ත අළු පැහැයේ සිට දුඹුරු පැහැය දක්වා වේ. පුෂ්ප හට ගැනීම බොහෝ දුරට ජනවාරි සහ පෙබරවාරි මාස වලදී සිදුවන අතර ඇතැම් විට අප්‍රේල්, මැයි, අගෝස්තු, සැප්තැම්බර් යන මාස වලද පුෂ්ප හට ගැනීම සිදුවේ.මල් හට ගැනීම උණුසුම් කාලගුණික තත්ත්වය යටතේ සිදුවේ.පත්‍ර සම්පූර්ණයෙන් හැලී ගිය විට රෝස පැහැති පුෂ්ප රාශියක් පොකුරු ලෙස ශාකයේ සෑම අතු රිකිල්ලක් පාසාම හට ගනී.පුෂ්ප දරණ කාලයට මෙම ශාකය ඉතාම අලංකාර දසුන් මවයි.පුෂ්ප පරාගනය, කෘමීන් මඟින් සිදුවන අතර ඇතැම් විට පැණි කුරුල්ලන් සහ සිවුරු හොරා වැනි පක්ෂි විශේෂ මඟින් ද එම කාර්යය සිදුවේ.එල හට ගැනීම පෙබරවාරි සිට අප්‍රේල් දක්වා සිදුවන අතර මෙය දිගැටිව පැලෙන සුළු ස්ඵෝටිකාවකි.මෙම ස්ඵෝටිකාව පියාපත් සහිත බීජ රාශියකින් සමන්විත වේ.බීජ ප්‍රරෝහණය පහසුවෙන් සිදුවේ.මෙම ශාකයේ පත්‍ර, මුල් සහ පුෂ්ප යන සියළුම කොටස් වල ඖෂධීය වටිනාකමක් ඇත. උණ හා වේදනාව, උගුරේ ආසාදන, මැලේරියාව සහ ගර්භාෂගත පිළිකා ආදිය සුව කිරීමට එම කොටස් භාවිතා කරයි.



*ආචාර්ය ඒ.එම්.ඒ.එස් අත්තනායක - නියෝජ්‍ය අධ්‍යක්ෂ*
*සුභාෂිණී සෙනෙවිරත්න - වැඩසටහන් සහකාර*
*රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය*